ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

# ගම්පහ අධ්‍යාපන කලාපය
# Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 10 | විෂයය Subject | කෘෂි හා ආහාර තාක්ෂණය - I | කාලය Time | පැය 03 |

නම : ..............................................................................................................

උපදෙස්

- ⋆ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ⋆ අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ⋆ සපයා ඇති උත්තර පත්‍රයේ ලකුණු කරන්න.

01. අනුරාධපුර යුගයේදී කෙරුණු ප්‍රථම වැව,

1. අභය වැව යි
2. කලා වැව යි.
3. තිසා වැව යි.
4. මින්නේරිය වැව යි.

02. 1822 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික කටයුතු සම්බන්ධීකරණය සඳහා පිහිටුවනු ලැබුවේ,

1. කෘෂිකර්ම දෙපර්තමේන්තුවයි.
2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවයි.
3. පේරාදෙණිය උද්භිද උද්‍යානයයි.
4. පේරාදෙණිය විශ්ව විද්‍යාලයයි.

03. ශ්‍රී ලංකාවේ කෘෂි පාරසරික කලාප 46 කි. ඒවා වර්ගීකරණය කර ඇත්තේ,

1. තෙත් කලාපයේ -20, අතරමැදි කලාපයේ -15 හා වියළි කලාපයේ -20 ලෙසින් ය.
2. තෙත් කලාපයේ -20, අතරමැදි කලාපයේ -15 හා වියළි කලාපයේ -11 ලෙසින් ය.
3. තෙත් කලාපයේ -15, අතරමැදි කලාපයේ -11 හා වියළි කලාපයේ -20 ලෙසින් ය.
4. තෙත් කලාපයේ -15, අතරමැදි කලාපයේ -20 හා වියළි කලාපයේ -11 ලෙසින් ය.

04. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වඩාත් සුළභ පස් කාණ්ඩය වනුයේ,

1. රතු දුඹුරු පස යි.
2. දියළු පස යි.
3. රතු කහ පොඩ්සොලික් පස යි.
4. රතු කහ ලැටසෝල් පසයි.

05. පහත රූප සටහනේ දැක්වෙන කාලගුණික උපකරණයේ නම හා ඉන් මැන ගන්නා කාලගුණික පරාමිතිය දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.



1. සූර්ය විකිරණ මානය - ආලෝක තීව්‍රතාව
2. සූර්ය දීප්තමානය - ආලෝකයේ ගුණාත්මය
3. සූර්ය දීප්තමානය - ආලෝකය පවතින කාලසීමාව
4. සූර්ය විකිරණමානය - ආලෝකය පවතින කාලසීමාව

06. පසක PH අගය 5.0 යන්නෙන් දැක්වෙන්නේ පාංශු ප්‍රතික්‍රියාව,

1. භාෂ්මික බවය 2. ආම්ලික බවය 3. උදාසීන බවය 4. ප්‍රහල ආම්ලික බවය

07. ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයක් වන්නේ,

1. තැටි පෝරුවයි 2. රොටවේටරයයි 3. රීජරයයි 4. තැටි නගුලයි

08. බෝග වර්ධනය සඳහා වඩාත් සුදුසු පාංශු තෙතමන මට්ටම,

1. තාවකාලික මැලවීමයි
2. සංතෘප්ත අවස්ථාවයි
3. ස්ථිර මැලවීමේ අංකයයි.
4. ක්ෂේත්‍ර ධාරිතාවයි

09. රුටේසියේ කුලයට අයත් බෝග වර්ග පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. දෙහි, දොඩම්, පේර, දිවුල්
2. දෙහි, දොඩම්, බෙලි, දිවුල්
3. බෙලි, දිවුල්, දොඩම්, කජු
4. බෙලි, දොඩම් , දෙහි, පේර

10. තවානක පැළ පේළි අතර අඩක් පිළිස්සූ දහයියා යෙදීමෙන්,

A තෙතමනය රඳවා ගත හැක.
B පොහොර යෙදීම අවශ්‍ය නොවේ.
C දිලීර රෝග පාලනය කල හැක.

මින් නිවැරදි වන්නේ,

1. A හා B ය. 2. A හා C ය. 3. B හා C ය. 4. A,B හා C ය.

11. ශ්‍රී ලංකාවට නිරිත දිග මෝසම් වැසි ලැබෙන කාල සීමාව වනුයේ,

1. මාර්තු - අප්‍රේල් ය.
2. මැයි - සැප්තැම්බර් ය.
3. ඔක්තෝම්බර් - නොවැම්බර් ය.
4. දෙසැම්බර් - පෙබරවාරි ය.

12. බෝග වගාවට ආලෝකයේ බලපෑම පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A නිල් සහ රතු ආලොක්ය ප්‍රභාසංස්ලේෂණයට හිතකර වේ.
B අඩු ආලෝකය තීව්‍රතාවයේදී පර්ව කෙටි වී ශාක මිටි වේ.
C දිගු දින ශාක යල කන්නයේ වගා කිරීමට සුදුසුය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

1. A හා B පමණි. 2. A හා C පමණි. 3. B හා C පමණි. 4. A,B හා C යන සියල්ලම.

13. WL යන සංකේතයෙන් හඳුන්වන කෘෂි දේශගුණික කලාපය වනුයේ,

1. පහත රට තෙත් කලාපය යි.
2. පහත රට අතර මැදි කාලාපය යි.
3. උඩරට තෙත් කාලාපය යි.
4. මැදරට තෙත් කලාපය යි.

14. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. තෙත් කලාපයේ වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1750 - 2500 වේ.
2. උෂ්ණත්වය පදනම් කරගෙන ප්‍රධාන දේශගුණික කලාප තුනකට බෙදා ඇත.
3. උඩරට කලාපයේ උච්චත්වය මීටර් 300 - 900 වේ.
4. කෘෂි දේශගුණික කලාප තව දුරටත් කෘෂි පාරිසරික කලාප වලට බෙදා ඇත.

15. අවසාදිත පාෂාණය දැක්වෙන පිළිතුර තෝරන්න.

1. හුණුගල්
2. නයිස්
3. ක්වාට්ස්
4. පෙග්මටයිට්

16. රෝල් ක්‍රමයට පාංශු වයනය සෙවීම සඳහා පස් ස්වල්පයක් තෙත්කර අත්ලට ගෙන ගුලියක් සදා රෝල් කිරීමේදී කැඩී ගියේය. මෙම පස,

1. වැලි පසකි. 2. මැටි පසකි. 3. ලෝම පසකි. 4. වැලි ලෝම පසකි.

17. ශ්‍රී ලංකාවේ පහත රට ප්‍රදේශයට වඩා නුවරඑළිය ප්‍රදේශයේ උෂ්ණත්වය අඩුවීමට බලපාන ප්‍රධාන හේතුව වන්නේ,

1. ශාක ගහනය යි. 2. මුහුදේ සිට ඇති දුරයි.
3. උච්චත්වය යි. 4. ජලාශ පිහිටා තිබීමයි.

18. පාංශු ක්ෂාරීයතාව උදාසීන කිරීමට පසට යෙදිය යුතු වන්නේ,

1. කැල්සියම් කාබනේට් ය. 2. ඩොලමයිට් ය.
3. ජිප්සම් ය. 4. හුණුගල් කුඩුය.

19. වෙළඳ වටිනාකමක් ඇති ජනප්‍රිය වානිජ බෝගයක් වන පැණි කොමඩු අයත් වන කුලය වන්නේ,

1. ෆැබේසියේ කුලයයි 2. කුකර්බිටේසියේ කුලයයි
3. මැල්වේසියේ කුලයයි 4. රූටේසියේ කුලයයි

20. පාංශු ආම්ලිකතාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ආම්ලික පසක ශාක වලට පොස්පරස් ලබා ගත නොහැකි තත්වයට පත් වේ.
2. ආම්ලික පසක බැක්ටීරියා ක්‍රියාකාරීත්වය ඉහල යි.
3. ආම්ලික පසක යකඩ, ඇලුමිනියම් ද්‍රාව්‍යතාවය අඩුය.
4. උෂ්ණත්වය අධික ප්‍රදේශ වල වාෂ්පීකරණය වැඩි වීම නිසා පස ආම්ලික වේ.

21. පසක කැටායන හුවමාරු ධාරිතාව මනිනු ලබන ඒකකයක් වනුයේ,

1. පස් ග්‍රෑම් 100 ට සෙන්ටිමෝල්
2. පස් ග්‍රෑම් 100 ට මිලිසමක
3. පස් කිලෝ ග්‍රෑමයට සෙන්ටිමෝල්
4. පස් කිලෝ ග්‍රෑමයට මිලිසමක

22. ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයේ මූලස්ථානය පිහිටි රට කුමක්ද?

1. ඉන්දියාව 2. පිලිපීනය
3. බංගලාදේශය 4. ශ්‍රී ලංකාව

23. වැටි හා කාණු ආකාරයට සකස් කළ ක්ෂේත්‍රයට සිටුවීම සඳහා සුදුසු බෝගය,

1. මුං 2. මිරිස් 3. කොහිල 4. ඉන්නල

24.



A



B



C

ඉහත A, B, C යන බෝග සංස්ථාපන උපකරණ නිවැරදි පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ.

1. ගොඩ බීජ වප්කරය, මඩ බීජ වප්කරණය, ගොයම් පැල සිටවනය
2. ගොයම් පැල සිටවනය, ගොඩ බීජ වප්කරය, මඩ බීජ වප්කරය
3. මඩ බීජ වප්කරය, ගොඩ බීජ වප්කරය, ගොයම් පැල සිටවනය
4. මඩ බීජ වප්කරය, ගොයම් පැල සිටවනය, ගොඩ බීජ වප්කරය,

25. අතුරු යත් ගෑමේ  උපකරණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. උදැල්ල, අත් මුල්ලුව, ජපන් රොටරි වීඩරය
2. උදැල්ල, අත් මුල්ලුව, රොටවේටරය
3. අත් මුල්ලුව, ජපන් රොටරි වීඩරය, රොටවේටරය
4. ටූල්කැරියර්, උදැල්ල, රිජරය

26. කුඩා වලවල් වල නිසි පරතරයක් ඇතිව බීජ සිටුවන බෝග පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. බණ්ඩක්කා, කරවිල
2. වට්ටක්කා, මිරිස්
3. පතෝල, රටකජු
4. බණ්ඩක්කා, රටකජු

27. පසේ ලවණතාව ඉවත් කිරීම සඳහා යොදා ගත හැකි ජල සම්පාදන ක්‍රමයකි.

1. ඇලි හා වැටි ජලසම්පාදනය
2. පිටාර ජල සම්පාදනය
3. විසිරි ජල සම්පාදනය
4. තීරු ජල සම්පාදනය

28. ජලය  සමග පොහොර මෙන්ම කෘෂි රසායන ද්‍රව්‍ය ද යෙදිය හැකි ජල සම්පාදන ක්‍රමය වන්නේ,

1. බිංදු ජල සම්පාදනය යි.
2. විසිරි ජල සම්පාදනය යි.
3. බේසම් ජල සම්පාදනය යි.
4. පිටාර ජල සම්පාදනය යි.

29. ජලවහනය දුර්වල පස්වලට සහ වර්ෂාව අධික කාල වලට යොදා ගැනීමට වඩාත් සුදුසුම තවාන් පාත්ති වර්ගය කුමක්ද?

1. බඳුන් තවාන්
2. ගිල් වූ පාත්ති
3. උස් පාත්ති
4. මට්ටම් පාත්ති

30. ගොවි මහතෙක් තම තවාන් පාත්තියක ඇති තවාන් පැළ වලට,

A ජලය සපයන කාලාන්තරය වැඩි කරන ලදී.

B ක්‍රමයෙන් සූර්යාලෝකයට පැළ නිරාවරණය වන කාලය වැඩි කරන ලදී.

ඉහත A,B ක්‍රියාවන් සිදු කරන්නට ඇත්තේ,

1. වල් පැළ පාලනය සඳහා ය.
2. රෝග පාලනය සඳහා ය.
3. පැළ ක්ෂේත්‍රයේ සිටුවීම පහසු වීම සඳහා ය.
4. පැළ දැඩි කිරීම සඳහා

31. පිළිස්සීම මඟින් ජීවානුහරණය කරන ලද පහත දැක්වෙන තවාන් පාත්තියේ ගිනි තැබීම කළ යුතු වන්නේ,




1. A දිශාවෙනි
2. B දිශාවෙනි
3. C දිශාවෙනි
4. D දිශාවෙනි

32. හෙරින් බෝන් ජල වහන කාණු රටාව දැක්වෙන පිළිතුර තෝරන්න.



1. 2. 3. 4.

33. පාංශු පැතිකඩක් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ස්වාභාවික තෘණ භූමියක දර්ශීය පාංශු පැතිකඩක් දැකගත හැක.
2. පාංශු පැතිකඩක ඉහලින්ම ඇත්තේ සංචායක කලාපයයි.
3. A,B,C හා R කලාප වල උස පාංශු ගැඹුර ලෙස හැඳින්වේ.
4. මාතෘ පාෂාණ ජීර්ණයෙන් හට ගන්නා මාතෘ ද්‍රව්‍ය B කලාපයේ තැන්පත් වේ.

34. උස් වූ තවාන් පාත්තියක පිහිටි බිමේ පස් මත අතුරන තවාන් පස් මිශ්‍රණයේ ඝනකම,

1. සෙ.මි. 3 කි. 2. සෙ.මි. 5 කි. 3. සෙ.මි. 10 කි. 4. සෙ.මි. 15 කි.

35. පසක් ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවේදී පවතින්නේ,

1. ගුරුත්වාකර්ෂණය හා ජලාකර්ෂක ජලයයි.
2. ගුරුත්වාකර්ෂණය හා කේෂාකරෂක ජලයයි.
3. කේෂාකර්ෂක ජලය හා ජලාකර්ෂක ජලයයි.
4. කේෂාකර්ෂක ජලය පමණි.

36. භූතල ජලවහන කාණු වර්ගයක් වනුයේ,

1. උළු කාණු ය. 2. ගල් කාණු ය. 3. විවෘත කාණු ය. 4. කොඩොල් කාණු ය.

37. අන්තර් ජාතික පාංශු විද්‍යා සංගමයේ වර්ගීකරණයට අනුව විෂ්කම්භය මි.මි. 2 - 0.2 දක්වා අංශු,

1. රොන්මඩ වේ. 2. සියුම් වැලි වේ. 3. බොරළු වේ. 4. රළු වැලි වේ.

38. ශ්‍රී ලංකාවේ වී පර්යේෂණ ආයතන පිහිටා ඇති ස්ථාන පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. මහඉලුක්පල්ලම හා බතලෙගොඩ
2. බතලෙගොඩ හා බෝඹුවල
3. ලබුදූව හා මහඉලුප්පල්ලම
4. බතලෙගොඩ හා ගන්නෝරුව

39. පසේ අඩංගු ඛණිජ වර්ගය අනුව පාංශු වර්ණය වෙනස් වේ. ඒ අනුව යකඩ අධික පසක්,

1. රතු පැහැතිය. 2. අළු පැහැයට හුරුය.
3. තද දුරුඹුරු පැහැතිය. 4. සුදු පැහැතිය.

40. පසක පාංශු ප්‍රතික්‍රියාව හෙවත් ආම්ලිකතාව හෝ භාෂ්මිකතාව තීරණය කෙරෙන පාංශු ද්‍රාවණයේ පවතින අයන වර්ග දෙක කුමක්ද?

1. $Na^+$ හා $OH^-$
2. $Ca^+$ හා $Na^+$
3. $H^+$ හා $OH^-$
4. $Ca^+$ හා $OH^-$

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gam ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gam ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 10 | විෂයය Subject: කෘෂි හා ආහාර තාක්ෂණය - II | කාලය Time: පැය 02 |

නම : .............................................................................................................................

උපදෙස්

* පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිටින ගොවි මහතෙක් තම ගෙවත්ත ආදර්ශ ගෙවත්තක් බවට සකස් කිරීමට අපේක්ෂා කරන ලදී.

(i) මෙම ප්‍රදේශය අයත්වන කෘෂි දේශගුණික කලාපය කුමක්ද?
(ii) මෙම ගෙවත්තේ වගා කළ හැකි සොලනේසියේ කුලයට අයත් ,
a. එළවළු වර්ගයක්
b. කුළුබඩු වර්ගයක් බැගින් ලියන්න.
(iii) පෘතුගීසීන් හා ලන්දේසීන් මෙරටට හඳුන්වා දුන් පළතුරු බෝග වර්ග දෙකක් සඳහන් කරන්න.
(iv) ඉහත ප්‍රදේශයේ සුළභව පවතින පස් කාණ්ඩය නම් කර එහි PH අගය පරාසය සඳහන් කරන්න.
(v) පසක ව්‍යුහය විනාශ වන ආකාර දෙකක් සඳහන් කරන්න.
(vi) මෙම ගෙවත්තේ සකස්කරන ලද වැටි හා කාණු පාත්ති වල සිටුවීමට උචිත බෝග වර්ග දෙකක් නම් කරන්න.
(vii) පසෙන් ජලය ඉවත්වන ක්‍රම දෙකක් නම් කරන්න.
(viii) තවාන් ජීවාණුහරණය කරන ක්‍රම දෙකක් සඳහන් කරන්න.
(xi) බෝගවල ප්‍රභා අවධි සංවේදීතාව අනුව කෙටි දින ශාක අර්ථ දක්වන්න.
(x) පසක භෞතික ලක්ෂණ දෙකක් නම් කරන්න.

02. දේශගුණික සාධක සුදුසු ලෙස ගලපා ගැනීමෙන් වගා කටයුතු සාර්ථක වේ.

(i) බෝග වගාව සඳහා උෂ්ණත්වයේ හිතකර බලපෑම් තුනක් ලියන්න.
(ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප උච්චත්වය අනුව බෙදා ඇති උප කලාප නම් කරන්න. එහි උච්චත්ව අගයන් දක්වන්න.
(iii) (a) වර්ෂාමානයක් සවි කිරීමේදී අවධානය යොමු කල යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
(b) බෝග වගාවට සුළඟේ හිතකර බලපෑම් දෙකක් ලියන්න.

03. ශ්‍රී ලංකාවේ අතීත කෘෂි කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය මඟින් නූතන කෘෂි කර්මාන්තය දියුණු කිරීමට වැදගත්ය.

(i) ශ්‍රී ලංකාවේ අතීත කෘෂිකර්මයේ ස්වයං පෝෂිත බව ළඟා කර ගැනීමට දායකත්වය දැක්වූ අංශ තුන නම් කරන්න.
(ii) ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපාන සාධක තුන නම් කරන්න.
(iii) (a) බෝග වර්ගීකරණයේ වැදගත්කම් දෙකක් ලියන්න.
(b) ප්‍රායෝජන අනුව බෝග වර්ගීකරණය කිරීමේදී, වැවිලි බෝග දෙකක්, අපනයන ආර්ථික බෝග දෙකක් බැගින් නම් කරන්න.

04. යහපත් පාංශු පරිසරයක් පැවතීම සාර්ථක බෝග වගාවකට වැදගත් වේ.

(i) කෘෂිකර්මයේදී පාංශු ඛණිජ වල වැදගත්කම් තුනක් සඳහන් කරන්න.

(ii) බෝග වගාව සඳහා පාංශු ජලයේ ඇති වැදගත්කම් තුනක් ලියන්න.

(iii) (a) පාංශු ක්ෂාරීයතාවයේ අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(b) පාංශු හායනය යන්න අර්ථ දක්වන්න.

05. බෝග වගාවේදී ඒ ඒ බෝග වලට උචිත ලෙස බිම් සකස් කිරීම වැදගත්ය.

(i) බිම් සකස් කිරීමේ අරමුණු තුනක් සඳහන් කරන්න.

(ii) බෝග සංස්ථාපනයේදී නිවැරදි ගැඹුර හා නිවැරදි පරතරය භාවිත කිරීමේ ප්‍රයෝජන තුනක් දක්වන්න.

(iii) (a) භාවිතා කරන අවස්ථාව අනුව බිම් සැකසීමේ උපකරණ වර්ග තුනකි. ඒවා නම් කරන්න.

(b) පොල් පැලයක් සිටුවීමේදී සකස් කරන තනි වගා වලක සම්මත දිග, පළල හා ගැඹුර සෙන්ටිමීටර වලින් දක්වන්න.

(c) අතුරුයත් ගැමේදී සිදුකරන ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

06. බෝග වගාවේදී ගුණාත්මක පැළ ලබා ගැනීම සඳහා තවාන් වල බීජ සංස්ථාපනය වැදගත් වේ.

(i) තවාන් සකස් කිරීම සඳහා සුදුසු ස්ථානයක් තේරීමේදී සලකා බැලිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

(ii) බීජ සංස්ථාපනය කළ පසු තවාන් පාත්තියක් මත වසුනක් යෙදීමේ වාසි තුනක් ලියන්න.

(iii) (a) නිරෝගී පැළ ලබා ගැනීම සඳහා තවානක් හොඳින් නඩත්තු කල යුතුය. එහිදී අනුගමනය කරන ක්‍රියා මාර්ග හතරක් ලියන්න.

(b) තවාන් පාත්තියකට සෙවන (ආවරණ) සකස් කරන ආකාරය ලියන්න.

07. බෝග වගාවේදී ජලයෙන් උපරිම ප්‍රයොජන ලබා ගැනීම වැදගත්ය.

(i) පාංශු ජලය සංරක්ෂණය සඳහා අනුගමනය කල හැකි ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් විස්තර කරන්න.

(ii) බෝග වලට ජල සම්පාදනය කිරීමේදී සැලකිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

(iii) (a) යහපත් ජලවහනයේ වාසි දෙකක් සඳහන් කරන්න.

(b) ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු 4ක් සඳහන් කරන්න.